# 'රක්‍ෂා බන්ධන්' උත්සවය සැමරීමෙන් සිදුවන යහපත හා එසේ නොකිරීමෙන් සිදුවන සාමාජික ගැටලු

***විකසිත, එස්. ලසිඳු*** [1]

උතුරු ඉන්දියානු සංස්කෘතියෙහි සැමරෙන ප්‍රධාන උත්සව හතර අතරින් ඉතාමත් සුවිශේෂී උත්සවයක් වශයෙන් '**රක්‍ෂා බන්ධන් උත්සවය**' හැඳින්විය හැකිය. ආධ්‍යාත්මික බැඳීම් සහ ස්නේහයෙන් පිරුණු මෙම උත්සවය සෑම වර්ෂයකම නිකිණි මාසයේ පසළොස්වක පොහෝ දිනයේදී සමරනු ලැබේ. අතීත බ්‍රාහ්මණ සමාජයේ විශේෂ උත්සවයක් ලෙස පිළිගැනුණු මෙම උත්සවයේදී බමුණන් තම පැරණි පූන නූල වෙනුවට නව පූන නූලක් කර පළඳින බව හින්දු මතයයි. නමුත් මෙහිදී මූලික පිළිගැනීම වන්නේ සහෝදරියන් විසින් තම එක කුස උපන් සහෝදරයින් වෙනුවෙන් හා සහෝදරත්වයෙන් සලකන්නන් වෙනුවෙන් පූජා පවත්වා '**රාඛී හුය**' ගැට ගැසීමේ චාරිත්‍රයයි. එසේම මෙම චාරිත්‍රයේදී ගරු කටයුතු වැඩිහිටියන්හටද, කුඩා දරුවන්හටද රාඛී හුය ගැට ගැසීමේ හැකියාව පවතී. සෑම සමාජයකම දිනෙන් දින බැඳීම් පළුදු වන කලෙක එම බැඳීම් වඩ වඩාත් ශක්තිමත් කර ගැනීමේ අවස්ථාවක් මෙවැනි උත්සව මඟින් සමාජයට ලැබේ. විශේෂයෙන්ම පවුලෙන්ම ආරම්භ කරමින් සමස්ත සමාජය හමුවේ බැඳීමේ වටිනාකම විදහා දක්වයි. එවැනි යහපත් ආදර්ශයක් රක්‍ෂා බන්ධන් උත්සවය මඟින් ඉන්දියානු සමාජයට ලබා දෙනු ලබයි. නමුත් බොහෝ විට මේ ආකාරයේ චාරිත්‍රයක් ඉටු කරන්නාවූ උත්සවයක් සමරනු ලැබුවද ඉන්දියානු සමාජයේ බොහෝ දුරට හිංසාවට පීඩාවට ලක් වන්නේ කිසියම් කෙනෙකුගේ සහෝදරියකි. මෙවන් වටිනා උත්සවවල අරුත වටහා නොගැනීම නිසා ඉන්දියානු සමාජයෙහි ගැටලු හටගන්නා ආකාරයක් පෙනී යයි. රක්‍ෂා බන්ධන් උත්සවය සැමරීම, එමඟින් සමාජයට සිදුවන යහපත, සහ එහි අරුත වටහා නොගැනීමෙන් සමාජයට ඇති වන ගැටලු සලකා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි.

**ප්‍රමුඛ පද:** රක්‍ෂා බන්ධන්, ඉන්දියානු සංස්කෘතිය, සමාජය, සහෝදරත්වය

*[1]ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*